# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,219 — 1964 නොවැම්බර් 10 වැනි අඟහරුවාද — 1964.11.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 27/39
ප. පා. දෙ.—ජීඊ 10/1/2/1

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති ඇති බලතල ප්‍රකාර, පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති, ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගඟබඩ පත්තුවේ පූගොඩ ගම්ප්‍රදේශයේ දනට පවතින ඡන්ද කොට්ඨාශ, ඡන්ද කොට්ඨාශවලට නැවත බෙද වෙන්කිරීමට අදලව 1964 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 14,174 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය, එහි උපලේඛනයේ I වැනි තීරයෙහි සඳහන් කපුගොඩ (418) යන දනට පවතින ඡන්ද කොට්ඨාශයට අනුරූපව II වැනි තීරයෙහි සඳහන් අංක 8 දරන ඡන්ද කොට්ඨාශයෙහි සීමා පිළිබඳ විස්තරයෙහි " කපුගොඩ ග්‍රාමය " යන වචන වෙනුවට " කපුගොඩ සහ මුලටියන " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

1964 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

11.–479/1.

---

ඇල්. ඩී.—බී. 27/39
ප. පා. දෙ.—ජීඊ. 10/1/2/1

### ගම්සභා ආඥපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දෙම්පෙ-මාපිටිගම ගම් ප්‍රදේශයේ දනට පවතින ඇතැම් ඡන්ද කොට්ඨාශ, ඡන්ද කොට්ඨාශවලට නැවත බෙද වෙන්කිරීමට අදලව 1964 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 14,174 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය, ඊට යාකොට ඇති උපලේඛනය වෙනුවට මීට යාකොට ඇති උපලේඛනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| වැනි තීරය<br>දනට පවතින ඡන්ද කොට්ඨාශ | | II වැනි තීරය<br>අළුත් ඡන්ද කොට්ඨාශ |
|---|---|---|
| දෙකටන—(401) ... | ... | අංක 1 දෙකටන, දෙකටන ග්‍රාමයෙන් සමන්විතය.<br>අංක 2 නාරම්පොල, නාරම්පොල ග්‍රාමයෙන් සමන්විතය. (කටුලන්ද සහ මොරගල ඇතුළුව).<br>අංක 3 පරන්ගොඩ, පරන්ගොඩ ග්‍රාමයෙන් සමන්විතය. |
| දියකාවිට—(404) | ... | අංක 6 දියකාවිට, දියකාවිට සහ ගනේගොඩ යන ග්‍රාම වලින් සමන්විතය.<br>අංක 7 ඉන්දෙලමුල්ල, ඉන්දෙලමුල්ල ග්‍රාමයෙන් සමන්විතය. |
| දෙම්පෙ—(405/411) | ... | අංක 8 දෙම්පෙ, දෙම්පෙ ග්‍රාමයෙන් සමන්විතය.<br>අංක 9 පාලුගම, පාලුගම ග්‍රාමයෙන් සමන්විතය.<br>අංක 10 කොරඹෙ, කොරඹෙ සහ දෙගාවත්ත යන ග්‍රාම වලින් සමන්විතය. |


913——ආර් 1938—4,800 (64/11)

| I වැනි තීරය<br>දැනට පවතින ඡන්ද කොට්ඨාශ | II වැනි තීරය<br>අළුත් ඡන්ද කොට්ඨාශ |
|---|---|
| ගිරිදර—(407) ... | ... අංක 11 ගිරිදර, ගිරිදර ග්‍රාමයෙන් සමන්විතය.<br>අංක 12 මාලින්ද, මාලින්ද ග්‍රාමයෙන් සමන්විතය. |
| පහල මාපිටිගම—(412) | ... අංක 14 පහල මාපිටිගම උතුර, පහල මාපිටිගම ග්‍රාමයේ දෙම්පෙ-මල්වාන පාරේ මධ්‍ය රේඛාවෙන් උතුරට ඇති කොටසින් සමන්විතය.<br>අංක 15 පහළ මාපිටිගම දකුණ, පහළ මාපිටිගම ග්‍රාමයේ දෙම්පෙ-මල්වාන පාරේ මධ්‍ය රේඛාවෙන් දකුණට ඇති කොටසින් සමන්විතය. |
| උඩ මාපිටිගම—(414) | ... අංක 17 උඩ මාපිටිගම උතුර, උඩමාපිටිගම ග්‍රාමයේ මාර ඇලේ මධ්‍ය රේඛාවෙන් උතුරට ඇති කොටසින් සමන්විතය.<br>අංක 18 උඩ මාපිටිගම දකුණ, උඩ මාපිවිගම ග්‍රාමයේ මාර ඇලේ මධ්‍ය රේඛාවෙන් දකුණට ඇති කොටසින් සමන්විතය. |
| වෙල්ගම—(415) ... | ... අංක 19 වෙල්ගම උතුර, වෙල්ගම ග්‍රාමයේ කඩවතයාවත්ත ඇලේ මධ්‍ය රේඛාවට උතුරින් පිහිටි කොටසින් සමන්විතය.<br>අංක 20 වෙල්ගම දකුණ, වෙල්ගම ග්‍රාමයේ කඩවතයාවත්ත ඇලේ මධ්‍ය රේඛාවට දකුණෙන් පිහිටි කොටසින් සමන්විතය. |
| සමනබැද්ද—(416) | ... අංක 21 යටෝවිට, යටෝවිට හා උඩමන්දල යන ග්‍රාම වලින් සමන්විතය.<br>අංක 22 සමනබැද්ද උතුර, සමනබැද්ද ග්‍රාමයේ යුත් ලන්සියාවත්ත-හන්වැල්ල පාරේ මධ්‍ය රේඛාවට උතුරින් පිහිටි කොටසින් සමන්විතය.<br>අංක 23 සමනබැද්ද දකුණ, සමනබැද්ද ග්‍රාමයේ යුත් ලන්සියාවත්ත-හන්වැල්ල පාරේ මධ්‍ය රේඛාවට දකුණින් පිහිටි කොටසින් සමන්විතය. |

11–479/2.

---

ඇල්. ඩී.—බී. 27/39
ප.පා.දෙ.—පී.ඊ. 10/1/2/1

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති, ඇලෙක්සැන්ඩර් පෙරේරා ජයසූරිය වන මම බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කැරගල ගම්ප්‍රදේශයේ දැනට පවතින ඇතැම් ඡන්ද කොට්ඨාශ ඡන්ද කොට්ඨාශවලට නැවත බෙදා වෙන්කිරීමට අදාලව 1964 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 14,174 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය, ඊටයා කොට ඇති උප ලේඛනයෙහි, මණ්ඩාවල (394) දැනට පවතින ඡන්ද කොට්ඨාශයට අනුරූප වූ (1) අංක 1 දරන ඡන්ද කොට්ඨාශයෙහි සීමා විස්තරය වෙනුවට පහත සඳහන් අලුත් විස්තරය, එනම් : '' අංක 1—මණ්ඩාවල මහවෙල උතුර—මණ්ඩාවල ග්‍රාමයෙහි මණ්ඩාවල මහවෙල ඇලෙන් උතුරට ඇති කොටසින් සමන්විතය '' යන්න ආදේශ කිරීමෙන් ද (2) අංක 2 දරන ඡන්ද කොට්ඨාශයෙහි සීමා විස්තරය වෙනුවට පහත සඳහන් අලුත් විස්තරය, එනම් :—

'' අංක 2—මණ්ඩාවල මහවෙල දකුණ—මණ්ඩාවල ග්‍රාමයෙහි මණ්ඩාවල මහවෙල ඇලෙන් දකුණට ඇති කොටසින් සමන්විතය '' යන්න ආදේශ කිරීමෙන් ද මෙයින් සංශෝධනය කරමි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

11–479/3

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි